# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1980 අංක 42 දරන
## සිංහල සංස්කෘතික ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 ඔක්තෝබර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 35 යි.

## 1980 අංක 42 දරන සිංහල සංස්කෘතික ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 60/79.

### සිංහල සංස්කෘතික ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"සිංහල සංස්කෘතික ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ආයතනයක්, ඒ ආයතනයට සම්බන්ධ සියලු කටයුතු, එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, ඵලදායී ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා වර්ෂ එක්දහස් නවසිය පනස් හතේ සිට පිහිටුවා තිබෙන හෙයින් ද:

තව ද, එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කට යුතු සඳහා ද, ඒ පරමාර්ථ සහ කටයුතු සියල්ල එකී ආයතනය විසින් මේ තාක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති බැවින් ඒ ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස ඉවහල් වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 42 දරන සිංහල සංස්කෘතික ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිංහල සංස්කෘතික ආයතනයේ දැනට සංස්ථා සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සංස්ථා සාමාජිකයන් ලෙස මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (ඔවුන් සංස්ථා සාමාජිකයන් ලෙස සිටින තාක් කල්) (මෙහි මින් මත "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සිංහල සංස්කෘතික ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එසේ සංස්ථාවක් බවට පත් විය යුතු ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ සහ සිය කැමැත්ත පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය සංස්ථාවට ඇති අතර එකී නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි දී නඩු පවරනු ලැබීම ද කළ හැකි ය. — සිංහල සංස්කෘතික ආයතනය සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාවේ සාමාජිකත්වය පිළිබඳ නියම හා කොන්දේසි සහ සාමාජිකයන්ගේ ඡන්ද අයිතිවාසිකම් සහ වෙනත් වරප්‍රසාද සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූල විය යුතු ය. — සංස්ථාවේ සාමාජිකත්වය.

(2) සාමාජිකත්ව වර්ග මෙසේ ය:—

(අ) සංස්ථා සාමාජිකයෝ, එනම්—

(i) ගරු සාමාජිකයෝ.

ප 43810—11,000 (79/08)

(ii) යාවජීව සාමාජිකයෝ,

(iii) සහාය සාමාජිකයෝ,

(iv) සාමාන්‍ය සාමාජිකයෝ ; සහ

(ආ) සංස්ථා නොවන සාමාජිකයෝ, එනම්—

(i) ශිෂ්‍ය සාමාජිකයෝ,

(ii) කණිෂ්ඨ සාමාජිකයෝ.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

4. සංස්ථාව පිහිටුවනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ මෙසේ ය :—

(අ) සිංහල සංස්කෘතිය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම ;

(ආ) තරුණ පරම්පරාව තුළ සිංහල සංස්කෘතිය පිළිබඳ උනන්දුවක් සහ අගැයීමක් ඇති කිරීම සහ වර්ධනය කිරීම ; සහ

(ඇ) සංස්ථාවේ වැඩ කටයුතු කර ගෙන යාම සඳහා භාරයක් පවත්වාගෙන යාම සහ එය කළමනාකරණය කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

5. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ ලබා ගැනීමේ ද, තම මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම නැතහොත් නංවාලීම සඳහා, අවශ්‍ය හෝ යෝග්‍ය කවර හෝ සියලු ක්‍රියා කිරීමේ ද, සියලු කරුණු ඉටු කිරීමේ ද සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

6. (1) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන නිලධාරීන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු පාලක මණ්ඩලයක් විසින්, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී ධූර දරන ආයතනයේ පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය යුතු ය.

**භාරකාර මණ්ඩලය.**

7. (1) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු භාරකාර මණ්ඩලයක් විය යුතු ය. ආයතනය විසින් මෙතෙක් කල් පිහිටුවා තිබූ භාරය පරිපාලනය කිරීමේ, කළමනාකරණය කිරීමේ සහ පාලනය කිරීමේ වගකීම භාරකාර මණ්ඩලය සතු විය යුතු ය. භාරකාර මණ්ඩලය විසින් තම බලතල ක්‍රියාත්මක කිරීම ද, කාර්යයන් ඉටු කිරීම ද, කර්තව්‍යයන් කිරීම ද සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී ආයතනයේ ධුර දරන භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

8. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම පිළිබඳව ද, පාලක මණ්ඩලයේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ නොයෙක් නිලධාරීන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම පිළිබඳව ද, රැස්වීම් කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිළිබඳව ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී, වැඩි ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය. ඒ රීති සාදනු ලැබූ විට, එවැනි ම රැස්වීමක දී (2) වන උපවගන්තියේ නියමයන්ට යටත් ව, වෙනස් කිරීම ද, ඒ රීතිවලට කිසිවක් එකතු කිරීම ද, ඒ රීති සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන කිසිම රීතියක්, සාමාන්‍ය රැස්වීමක දී ඡන්දය දෙන ඡන්ද හිමි සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකවත් ඡන්දයෙන් හැර, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඊට කිසිවක් එකතු කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින බල පවත්නා ආයතනයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද, සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ආයතනයෙන් අය විය යුතු සහ ආයතනයට ගෙවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී පවතින ආයතනයේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා, ගෙවනු ලැබිය යුතු අතර ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සියලු දායක මුදල් සහ සහභාග මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකි විය යුතු අතර ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලීන රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් තබා ගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නාම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.